www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමාගේ මූල්‍ය ප්‍රතිසංස්කරන පනතඃ වෝල් වීදිය "සැනසුම් සුසුමක්" හෙලයි

## Obama's financial reform bill: Wall Street breathes a "sigh of relief"

2010 මැයි 25

ඇත්ත වසයෙන් ම කරුනු "ඒවා ම වෙනුවෙන් කතා නො කරතත්" සමහර කරුනු අනෙක් ඒවාට වඩා කතා කරයි. ඇසෝසියේටඩ් ප්‍රෙස් මැයි 21 වාර්තාවේ මෙම අයිතමය එයට උදාහරනයකිඃ "මූල්‍ය කර්මාන්තය පුරා වසා සිටි අවිනිශ්චිත භාවයේ වලාකුලක් ඉවත දමමින් මූල්‍ය ප්‍රතිසංස්කරන පනතක් සෙනට් සභාව විසින් සම්මත කරනු ලැබීමෙන් දිනකට පසුව සිකුරාදා මූල්‍ය කොටස් මිල ඉහල නැගුනි."

කෙසේ වෙතත් ඇමරිකානු මහජනයා හෝ ඔවුන්ගේ අඩුවෙන් සංශයවාදී කොටස් මාධ්‍ය ආවරනය මත පාදකව එක්සත් ජනපද කොංග්‍රසයේ කොටස් දෙකින් ම මූල්‍ය ප්‍රතිසංස්කරන නීතියක් සම්මත වීම මගින් යම්කිසි වැදගත් දෙයක් සිදුවී ඇතැයි විශ්වාස කිරීම පිලිබඳව සමාව දිය හැකි ය. (වෝල් වීදියේ විරුද්ධත්වයට ලක් විය හැකි යයි පෙනෙන කොටස් තවදුර කප්පාදු කරමින් පනතෙහි අවසන් සංස්කරනය එලැඹෙන සති කිහිපයේ දී හවුස්-සෙනට් මන්ඩලයක් විසින් සකස් කරනු ලැබීමට නියමිත ය.)

ලාක්ෂනික ප්‍රධාන මාතෘකාවන් වන්නේ "වෝල් වීදියට මුහුන දීම," "වෝල් වීදියේ විනෝද ගමන අවසන් කිරීම," "මූල්‍ය කුනාටු අලුත්වැඩියා කිරීම," "සෙනට් සභාව ප්‍රධාන බැංකු සහ නය තක්සේරු සමාගම් සියල්ලට බලපාන ප්‍රතිසංස්කරනය සම්මත කරයි," "සෙනට් සභාව පනත සම්මත කරද්දී මූල්‍ය ප්‍රතිසංස්කරනයේ සැතපුම් කනුවක් කරා ලඟා වේ," ආදිය යි.

ඩිමොක්‍රටික් පාක්ෂික දේශපාලනඥයන්ගේ ප්‍රකාශන ව්‍යාජ ලෙස පිම්බූ හා ඒ සමානව ම හිස් ඒවා වේ. "වෝල් වීදියේ කෑදරකම ඇමරිකානු බදු ගෙවන්නන්ගේ රැකියා විනාශ කොට ජීවන ඉතුරුම් හිස් කල අතර ඉන් පසු ආර්ථිකය බැවුමෙන් කඩා වැටීම වැලැක්වීමට විනාශය ඇති කල මහා බැංකු සහ මහ ව්‍යාපාරික අවශ්‍යතාවලට ඇප ලබා දීමට ඔවුන්ට බලකෙරුනා. වගකීම් සහගතභාවය සහ විශ්වාසවන්තභාවය පුනස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය වූ අතර අද දින ඡන්දය ඒ සඳහා දරන උත්සාහයේ තීරනාත්මක පියවරක්," යයි මැසචුසෙට්ස් සෙනට් සභික සහ හිටපු ජනාධිපති අපේක්ෂක ජෝන් කෙරී පසුගිය බ්‍රහස්පතින්දා ප්‍රකාශ කලේ ය.

කෙරී කතා කරන්නේ කවර විශ්වාසවන්තභාවයක් ගැන ද? මූල්‍ය සංගත බිඳ දැමීමක් හෝ පවරාගැනීමක් සිදු නො කරනු ඇති අතර බැංකුවල හෝ වෝල් වීදියේ විධායක නිලධාරීන් සිරගෙට යැවීම පසෙක තැබුවත් ඔවුන්ට එරෙහි අපරාධ විමර්ශනයක් පිලිබඳ ඡායාවක්වත් නැත. රට පහතට ම ඇදහෙලා ඇති හොරකම් කරන ලද ප්‍රකෝටිපතියන් ගැන සලකතොත් ආදර්ශ පාඨය වන්නේ "අපි ඉදිරියට යමු" යන්න යි.

කෙරී සහ අනෙකුත් ඩිමොක්‍රටිකයන් කෝපයට පත් ජනයාව සනසනු ඇතැයි අපේක්ෂා කරන විකාර සහගත කථා හඬනගා කියමින් සිටී. වොෂින්ටනයේ හෝ වෝල් වීදියේ කිසිවෙක් ඒවා මොහොතකටවත් විශ්වාස නො කරති. මූල්‍ය කොටස් වෙලඳමේ යෙදෙන වඩා සිහිබුද්ධිය ඇති මිනිස්සු සහ ගැහැනු සිකුරාදා ඔවුන්ගේ විනිශ්චය දුන්හ. "පනත පිලිබඳ පුවත නිවේදනය කරද්දී බොහෝ මූල්‍ය හුවමාරු-වෙලඳම් අරමුදල් තම කොටස් වඩා ඉහල යාම දැක ගත්තේ යැ"යි එක් නිරීක්ෂකයෙක් සටහන් කලේ ය. මේ අතරට අයිෂෙයාර්ස් ඩව් ජෝන්ස් එක්සත් ජනපද මූල්‍ය සේවා දර්ශක අරමුදල, මෙරිල් ලින්ච් ප්‍රාදේශීය බැංකු කරුවන්, සහ අයිෂෙයාර්ස් එස් ඇන්ඩ් පී මූල්‍ය අංශ දර්ශක අරමුදල යන සියල්ලේ කොටස් මිල සියයට 2කට වැඩි ප්‍රමානයකින් ඉහලයාම අයත්ය.

ඒපී ආයතනය තවදුර සුවිශේෂී කරුනු ඉදිරිපත් කලේ යඃ "අපරභාග වෙලඳමේ දී ජේපී මෝර්ගන් චේස් සහ සමාගමේ කොටස් ඩොලර් 2.02කින් හෙවත් සියයට 5.4කින් ඩොලර් 39.85 දක්වා ඉහල ගියේ බෑංක් ඔෆ් ඇමරිකා සංගතයේ කොටස් ශත 59කින් හෙවත් සියයට 3.8කින් ඩොලර් 15.89ක් දක්වා ඉහල නැගෙද්දී ය. සිටිග්‍රෑප් සංගතයේ කොටස් ශත12ක් හෙවත් සියයට 3.3කින් ඩොලර් 3.75 දක්වා නැගිනි. පැරනි ආයෝජන බැංකුවල කොටස් ද ඉහල ගියේය. මෝර්ගන් ස්ටැන්ලිහි කොටස් ඩොලර් 1.27කින් හෙවත් සියයට 5කින් ඩොලර් 26.91ක් දක්වා ද ගෝල්ඩ්මන් සැක්ස්හි කොටස් ඩොලර් 6.15කින් හෙවත් සියයට 4.5කින් ඩොලර් 142.25 දක්වා ද ඉහල නැගුනි.

මහා බැංකු සහ මූල්‍ය ආයතන පවතින්නේ "තෝන් ලනුව නහයට වැටීමේ" අද්දර වුවත් කිසිවෙක් ඔවුන්ට ඒ බව නො කියති. ස්වාභාවිකව ම වෝල් වීදිය තමන් මත කිසිදු පාලනයක් පැනවීමට අකමැති වේ. එහෙත් අවසානයේ දෙවන හොඳ ම දෙය වන්නේ ඔබාමාගේ මෙන් කඩදාසි වැඩ වැඩි වන බල රහිත පියවරයන් ය. වඩා දක්ෂ නීතිඥයෝ සහ මූල්‍ය විශාරදයෝ "තද" නව නීති හරහා සහ ඒ වටා තම කටයුතු හසුරුවා ගතහැකි හොඳ ම ක්‍රමෝපායන් ගනන් බලමින් සිටිති. මෙම කාර්යය සාපේක්ෂව අනභියෝගී බව ඔවුන් තේරුම් ගනිතැයි අපි පුරෝකථනය කරමු.

"ප්‍රතිසංස්කරන හැඩගැන්වෙද්දී වෝල් වීදිය මත යම් සහන" නමින් නිව් යෝක් ටයිම්ස් පුවත්පතේ පලවූ ලිපියක් මූල්‍ය කර්මාන්තයේ මනෝගතිය සම්පින්ඩනය කොට දැක්වීය. *ටයිම්ස්* ලිපිය මෙසේ සටහන් කරයිඃ "වෝල් වීදියේ ආරම්භක තීරනයෙන් පෙනෙන්නේ එය වඩා කෲර විය හැකිව තිබුනු බවයි. කාරනයේ සංවේදීතාව හේතුවෙන් නම සඳහන් නො කරන්නැයි ඉල්ලා සිටි එක් පරිනත ආයෝජන බැංකුකරුවෙක් කියා සිටියේ 'ඔබ යමෙකුට පුද්ගලිකව කතා කලහොත් එය සැනසුමට කාරනයකි' යනුවෙනි. 'ආරම්භයේ දී එය ලාභ තටාකය සියයට 15ක් හෝ 20කින් හකුලා දමා ප්‍රමාද හා එකඟතා ගාස්තු ඉහල දමතත් කිසිදු ආයතනයක් අහෝසි කිරීම හෝ කරදරකාරී නව බඳු පැනවීමක් සිදු නො කෙරේ.'"

"විශේෂඥයන්ට අනුව පහත වැටෙන ලාභය පියවාගැනීමට නව ආදායම් ධාරා නිර්මානය කරමින් ද නව නීති වට කොට ක්‍රියාකිරීමේ මාවත් සොයමින් ද මහා බැංකු සහ උකස් සමාගම් වෙනස්කම්වලට අනුව හැඩගැසෙනු ඇත. වෙනත් වචනවලින් කියතොත් සියල්ල අවසානයේ කර්මාන්තයේ උද්‍යාන භූමිය භූ චලනයකට මුහුන නො දෙයි," යයි *ටයිම්ස්* ලිපිය දිගට කියාගෙන යයි.

ඇමරිකානු දේශපාලන උද්‍යාන භූමිය සහ 2008 සැප්තැම්බරයේ පටන් සිදු වී ඇති සිද්ධි සමග අවම මට්ටමින් සමීප අයෙක් පවා මෙමගින් තැති ගන්වනු නො ලබයි. එහි පූර්වගාමියා මෙන් ම ඔබාමා පරිපාලනය ද එක් කේන්ද්‍රීය ඉලක්කයක් සිත තබාගෙන ආර්ථික අර්බුදයට මැදිහත් වී ඇත. එනම් සුවිසල් බැංකුවල සහ වෝල් වීදියේ සමාගම්වල ලාභ සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම යි. පසුව කිවූ ආයතනවලට ට්‍රිලියන ගනනින් මුදල් පොම්ප කර ඇත්තේ මිලියන ගනන් ජනයා සිය රැකියා අහෝසි වීම, සිය නිවාස යලි අත්පත් කරගැනීම හෝ ඒවායේ මිල ඇදවැටීම සහ අත්‍යවශ්‍ය සමාජ වැඩසටහන් කප්පාදු කිරීම දැක ගනිද්දී ය.

ප්‍රධාන පක්ෂ දෙකෙහි ම දේශපාලනඥයෝ විශාල මෙන් ම එතරම් විශාල නො වන මූල්‍ය ආයතනවල සාක්කු තුල පහසුවෙන් විවේක ගනිති. "2008 මැතිවරන කාලසීමාවේ හටගත් උප-ප්‍රථමක උකස් නය අර්බුදය සහ අවසානයේ වෝල් වීදියේ බිඳවැටීම මධ්‍යයේ පවා ප්‍රධාන අපේක්ෂකයන්ට සහ පක්ෂවලට ඩොලර් මිලියන 37කට වැඩියෙන් ප්‍රදානය කිරීමට බැංකුවලට හැකි වී" යැයි ඕපන්සීක්රට්ස්.ඕර්ග් වෙබ් අඩවිය විස්තර කරයි. බැරැක් ඔබාමා, හිලරි ක්ලින්ටන් සහ එක්සත් ජනපද සෙනට් සභිකයන් වන කෙරී, ක්‍රිස්ටෝෆර් ඩොඩ්, චාල්ස් ෂූමර් සහ රිචඩ් ෂෙල්බි යන අය වානිජ බැංකුවලින් උද්ඝෝෂන අරමුදල් ලබන්නන් අතර මෑත වසරවල වඩාත් ම ජනප්‍රිය අය බවට පත්ව ඇත්තා හ.

මෙම කොන්දේසි යටතේ ඇමරිකානු පාලක ප්‍රභුව වෝල් වීදියේ සිය මිතුරන් මත කඩා පනී යයි, ඔවුන්ගේ මුදල් ඉපයීමට හෝ දුරදිග යන වඩා විශාල මූල්‍ය අර්බුද ඇති කිරීමට ඔවුන්ට ඇති ධාරිතාවට බාධාකිරීමට කුමක් හෝ කරනු ඇතැයි සිතනු ඇත්තේ ඉතා මෝඩ පුද්ගලයෙක්, දේශපාලන තකතීරුවෙක්, හෝ ද නේෂන් සඟරාවේ කතුවරයෙක් පමනි.

"සියල්ල අලලාගත්" මූල්‍ය ප්‍රතිසංස්කරන පනතට අඩු හෝ වැඩි වසයෙන් සමගාමීව, සමාගමක් ආසන්න වසයෙන් බංකොලොත් භාවයට පමුනුවමින් ඩොලර් බිලියන 180ක ආන්ඩුවේ ඇපතැබීමකට මගපෑදූ උකස්-සම්බන්ධිත ගනුදෙනුවල නිරත වූ ඇමරිකන් ඉන්ටර්නැෂනල් ගෲප් සංගතයේ හිටපු විධායක නිලධාරියෙකුට එරෙහිව චෝදනා ගොනු නො කිරීමට ඔබාමාගේ අධිකරන දෙපාර්තමේන්තුව තීරනය කර ඇතැයි යන පුවත පැමිනියේ ය.

"ආදායමට වඩා ඉහලින් දිවි ගෙවන", "පටි තදකර ගතයුතු" මහජනතාව මත කප්පාදු පියවර පටවන්නේ අධික වියදම් සහිත ඇඳුම්වලින් සැරසුනු මංකොල්ලකරුවෝ තම ව්‍යාපාරවල නිරත වෙද්දී ය.

මෙම යථාර්ථය පිලිබඳ වැඩෙන හැඟීමක් මහා ව්‍යාපාරික ක්ෂේත්‍රයට එරෙහි යෝධ මහජන කෝපයක් ජනනය කරමින් තිබෙන අතර කෝපරේට්-මූල්‍ය ප්‍රභූ තන්ත්‍රයේ හිමිකමට සහ ක්‍රියාත්මක කිරීමට යටත් වර්තමාන දේශපාලන යන්ත්‍රනය තුල එම කෝපය ප්‍රකාශනයක් අත්පත් කර ගත නො හැක. තමන්ගේ ම සමීක්ෂනයක ප්‍රතිඵල මත පදනම්වන බ්ලූම්බර්ග් මෑත දී සඳහන් කල පරිදි "බොහෝ දෙනා නීතියක් අවශ්‍ය යයි පෙන්නුම් කරමින් සමීක්ෂනයේ දී වෝල් වීදිය අවමානයට ලක් කල හ." මෑත දී කරන ලද හැරිස් මත විමසීමකට අනුව වෝල් වීදය මත "අතිශය විශ්වාසවන්තභාවය" මහජනයා අතරින් යන්තම් සියයට 8ක් පමනක් පලකලේ කොංග්‍රසය මත මහජනයා අතර පවතින අවිශ්වාසය සහ අකමැත්ත සමග පමනක් සැසඳෙන අතෘප්තිකර භාවයේ දර්ශකයක් පෙන්නුම් කරමිනි.

මහජනයාගේ සහජාසයන් නිවැරදි වන නමුත්

මූලා‍ය පද්ධතිය අව්‍යාජව "උඩු-යටිකුරු කිරීම" කෙරෙනු ඇත්තේ පවත්නා දේශපාලන පද්ධතියෙන් සම්පූර්නයෙන් ම බිඳී වෙන්වීමේ පදනම යටතේ පමනි.

එක ම ප්‍රගතිශීලී විකල්පය වන්නේ කම්කරු පන්තිය සහ තරුන ජනයා අතර ගොඩනංවන පුලුල් සමාජවාදී ව්‍යාපාරයක් පමනි. එවැනි ව්‍යාපාරයක් සභාය රැලි කරගනු ඇත්තේ මූලා‍ය බිඳවැටීමට වගකිව යුත්තන් අපරාධ පරීක්ෂනයකට භාජනය කිරීම, ඇමරිකානු සංගත අවශ්‍යතා විසින් සොරකම් කරන ලද ට්‍රිලියන ගනන් යලි අත්පත් කරගැනීම, නිවාස සින්නවීම් සහ යලි අත්පත්කරගැනීම් නැවැත්වීම, රැකියා, අධ්‍යාපනය සහ සෞඛ්‍යයට බිලියන ගනනින් මුදල් වෙන්කිරීම, විශාල බැංකු සහ වෝල් වීදියේ සමාගම් ජනසතු කිරීම වැනි ඉල්ලීම් පිටුපසිනි.

ඩේවිඩ් වොල්ෂ්

© www.wsws.org